| 2020.07.08 | සෙවන ග්ලාස් හවුස් - බළන්ගොඩ නව බස්නැවතුම්පල පොලිස් මුරකුටිය ඉදි කිරීමේ කර්මාන්තයේ වීදුරු දොරවල් සවිකිරීම. | 38 | 019977 | 129,276.50 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.47 2020 ජූලි මස කර්මාන්ත අංශය මඟින් සිදු කිරීමට අපේක්ෂිත කර්මාන්ත සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

01. ගල්වලපාර අළුත්වැඩියා කිරීම.
02. සුදර්ශනපුර කාණු පද්ධතිය හා ඉහළ කොටස තාර දමා අළුත්වැඩියා කිරීම.
03. බෝම්බුව මිරිස්කොටුව මාර්ගය අලුත්වැඩියා කිරීම.
04. දෙහිගස්තලාව තලාව පාර නඩත්තු කිරීම.
05. රන්දිලු ගෙස්ට් මාර්ගය අලුත්වැඩියා කිරීම

**ඉදිරි මාස 06 සඳහා අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදුකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය**

| | |
|---|---|
| තාර බැරල් | 100 |
| 1 1/2 ගල් කියුබ් | 15 |
| මි.මී.100 කම්බි | 200 |
| චිප් ගල් කියුබ් | 15 |

| | |
|---|---|
| සිමෙන්ති | 50 |
| 3/4 ගල් කියුබ් | 25 |
| වැලි කියුබ් | 25 |
| 6X9 ගල් | 10 |

**මෙම කර්මාන්ත සඳහා අවශ්‍ය කම්කරුවන් ප්‍රමාණය**

දිනකට සේවකයින් 15 බැගින් දින 25 කට මාසිකව කම්කරුවන් 375 ක් අවශය වේ

**මෙම කර්මාන්ත සඳහා මාසිකව අවශ්‍ය රථවාහන**

| | |
|---|---|
| ටිපර් රථය | දින 25 |
| ට්‍රැක්ටර් රථය | දින 25 |
| D/D රෝල | දින 15 |
| JCB යන්ත්‍රය | පැය 20 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.48 ජේ.එම්.ලාල් ප්‍රේමසිරි මහතා ලබා ගත් විශේෂ අත්තිකාරම් මුදලට අදාළ එක් වාරිකයක් වැඩිපුර අය වී ඇති බැවින් එම රු.414.68 මුදල ආදායමින් ආපසු ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.49 දොරවෙල මාර්ගයට යාබදව පිහිටි බිම් කොටස රිචඩ් ප්‍රැන්සිස් යන අයට බිම් කුලියක් අය කිරීමේ පදනම මත ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා දීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.50 ගිනි නිවීමේ කාර්යයයේ නියුතු කාර්ය මණ්ඩලයේ උපදේශක ලෙස ශ්‍රී ලංකා ගිනි නිවීමේ වෘත්තිකයන්ගේ සංගමයේ සභාපති රුක්ෂාන් බුවනෙක මහතා පත් කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.51 වාරික වශයෙන් ගෙවීමේ පදනම මත බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතිය සඳහා දාහකයක් (Incinerator) සවි කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.52 දැනට කොම්පෝස්ට් අංගනයේ ගොඩ ගැසී ඇති නොදිරන කසළ ප්‍රමාණය එම ස්ථානයෙන් ඉවත් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.53 අනවසර දැන්වීම් පුවරු සඳහා විසඳුමක් ලෙස නගර සීමාව තුළ විද්‍යුත් ප්‍රචාරක දැන්වීම් පුවරු ස්ථාපිත කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.54 මහාධිකරණ නඩු අංක WA /25/2019 යටතේ ලිඛිත දේශන ගොනු කිරීම වෙනුවෙන් නීතිඥ ගාස්තු ලෙස රු.25000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.55 W.L. ආනන්ද යන අයට කාර්පාර්ක් අංක 06 කඩ කාමරය වෙනුවට පදික කඩ කාමරයක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

කීමනි මුදල ලබා නොගෙන දිනකට රු.50 ක මුදලක් අය කර ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා ගෙන ආ යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.56 නගර සභා මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා කාර්යසාධන ණය මුදල රු.100,000.00 ක් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.57 ආපදා ණය ලබා ගැනීම.-

| | | |
|---|---|---|
| කළමනාකරණ සේවා නිළධාරි | - ඊ.එම්.එන්.හර්ෂණී | - රු.250,000.00 |
| සංවර්ධන නිළධාරී | - නයනි යසවර්ධන මිය | - රු.250,000.00 |
| කළමනාකරණ සේවා නිළධාරි | - ශ්‍යාමා නිලානි මිය | - රු.250,000.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.58 බළන්ගොඩ තානායමේ ටෙන්ඩර්කරු විසින් බඳු ගිවිසුම් කොන්දේසි උල්ලංඝනය කිරීම මත ගිවිසුම අහෝසි කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, පසුගිය මස තානායම් ටෙන්ඩර්කරු විසින් ගෝන මස් විකුණා අසු වීම මත දඩයක් ගෙවා ඇති අතර ටෙන්ඩර් කොන්දේසි අනුව එය වැරැද්දක් බැවින් අද දින සභාවේදී මේ පිළිබඳ දැනුවත් කිරීමක් සිදුකර ඇති බවද සභාවේ

කීර්තිනාමයට කැළැලක් සිදුවී ඇති නම් මිස වෙන අලාභයක් සිදු වී නොමැති බව ද පවසන ලදී.

ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා අදහස් දක්වමින් අදාළ ටෙන්ඩර්කරු තමාගෙන් සිදු වී ඇති වරද පිළිගෙන ඇති බැවින් නැවත වරක් මෙවැනි දෙයන් සිදුනොවීමට වග බලා ගන්නා ලෙස අවසන් වතාවට ලිඛිතව දැනුවත් කරන ලෙස පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පවත්නා Covid-19 වසංගත තත්ත්වය හමුවේ තානායම වැඩි මුදලකට ටෙන්ඩර් කිරීමට නොහැකිවන බවද පවසන ලදී.

මේ සම්බන්ධයෙන් දීර්ඝව සාකච්ඡා කිරීමෙන් අනතුරුව තානායම් ගිවිසුම අවසන් වීමට වසර එක හමාරක් වැනි කෙටි කාලයක් පවතින බැවින්ද, ඉහත කරුණු සම්බන්ධයෙන් සභාවට මූල්‍යමය අලාභයක් සිදුවී නොමැති බැවින්ද තානායම නැවත ටෙන්ඩර් කිරීමේදී සැලකිය යුතු කාල සීමාවක් ගත වන බැවින් ද තානායම දැනට අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බැවින්ද අදාළ වරද සම්බන්ධයෙන් අවවාද කර බදුකරු දැනුවත් කිරීමට තීරණය වූ අතර බදු ගිවිසුම මෙම අවස්ථාවේදී අවලංගු නොකිරීමට ද සභාව විසින් තීරණය කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.59 වසම් මට්ටමින් ක්‍රියාත්මක කරන ලද ගෙවතු වගා තරඟය සඳහා ඉදිරිපත්වූවන් අතරින් තිදෙනෙකු තෝරා ගනිමින් ප්‍රථම ස්ථානය සඳහා රු.10,000.00 ක මුදලක් ද දෙවන ස්ථානය සඳහා රු.7,500.00 ක් ද තෙවන ස්ථානය සඳහා රු.5,000.00 ක මුදලක්ද ලබා දීමටත් විනිශ්චය මණ්ඩලය සඳහා ත්‍යාග ලබා දීම සඳහාත්, සහභාගි වූවන් සඳහා 25Kg කොම්පෝස්ට් පොහොර මිටිය බැගින් ලබා දීම සඳහාත් සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් කොවිඩ් 19 රෝග තත්ත්වය පැතිරීම සමඟ බළන්ගොඩ නගර සභාව ඒ සඳහා සිදුකළ ව්‍යාපෘතියක් බවට වාර්තාවක් සකස් කරන ලෙසද කාර්ය සාධන තරඟයේදී මේ සඳහා ලකුණු හිමිවන බවද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.60 තුරු උයන සඳහා සිමෙන්ති බංකු 06 ක් ලබා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.61 2020 ක්‍රියාකාරි සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.62 2020 ප්‍රසම්පාදන සැලැස්ම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.63 තුරු උයන සඳහා ගේට්ටුවක් සවි කිරීම.( ඇස්තමේන්තු මුදල රු.80,000.00)

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.64 වට රවුම් නඩත්තු කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| | | |
|---|---|---|
| මල්පැල හා පොහොර මිළදී ගැනීම සඳහා | - | රු.27,680.00 |
| කම්කරු වැටුප් ගෙවීම සඳහා | - | රු.10,500.00 |
| කොහුබත් මිළදී ගැනීම සඳහා | - | රු.10,000.00 |
| තණකොළ පිඩදි මිළදී ගැනීම සඳහා | - | රු.37,500.00 |

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.65 මැණික් කඩ අංක 06 කාමරයෙහි බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

මැණික් කඩ අංක 06 කාමරයේ බදු අයිතිය වෙනස් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමේ යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මෙම කඩ කාමරයේ වර්තමාන බදු ගැනුම්කරු වන එච්.කේ. නන්දනී අල්විස් යන අය විසින් යූ.එල්.අබ්දුල් මජීඩ් යන අය වෙත අතුරු බදු දී ඇති බව අනාවරණය වී ඇති බව පවසන ලදී. එබැවින් පළාත් පාලන කොමසාරිස්ගේ 1/2009 චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කරමින් අදාළ කඩ කාමරය අතුරු බදුකරුට පැවරීම සුදුසු බවට ගරු සභාව විසින් තීරණය කරන ලදී. ඒ අනුව වර්තමාන කඩකුළිය මත පදනම්ව කී මනි මුදල ගණනය කර ඉන් 25% ක මුදලක් අය කර අතුරු බදුකරු වන යූ.එල්.අබ්දුල් මජීඩ් යන අය වෙත ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.66 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ ලබා දීම සඳහා ස්පීකර් සෙට් එකක් මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ලබා දී ඇති Crown Invenstment (Pvt) Ltd වෙතින් ඉදිපත් කර ඇති රු.26,990.00 මිළ ගණන අනුමත කිරීම.

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06.01.67 කාර්යාලය සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා කැඳවන ලද මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කර ඇති ජෝති ස්ටෝර්ස් වෙතින් ඉදිරිපත් කර ඇති මිළ ගණන් සඳහා පහත සඳහන් පරිදි සභා අනුමැතිය ලබා ගැනීම.

| වර්ගය | ප්‍රමාණය | ඒකක මිළ |
|---|---|---|
| A4 | බන්.100 | රු.685.00 |
| ඉදල් | 100 | රු.150.00,<br>රු.170.00 |
| ප්ලාස්ටික් කොසු | 50 | රු.170.00 |

| | | |
|---|---|---|
| CR පොත් පිටු 80 | 10 | රු.80.00 |
| බිලුඩෝ ක්ලිප් | 30 | රු.35.00 |
| ලොකු සෙලොටේප් | 30 | රු.42.50 |
| පොඩි සෙලෝටේප් | 25 | රු.25.00 |
| 50ml ගම් බෝතල් | 20 | රු.20.00 |
| එයාර් ෆෙෂ්නර් | 10 | රු.350.00 |
| නෝමල් ෆයිල් | 400 | රු.4.85 |
| A4 Colour | 01 | රු.1100.00 |
| A4 Colour | 01 | රු.1200.00 |
| A4 Colour | 01 | රු.1250.00 |
| ලයිෆ්බෝයි | 1000 | රු.50.00 |
| දෙපියන් ෆයිල් | 100 | රු.65.00 |

ඉහත යෝජනාව ගරු සභාපතිතුමන් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. කර්මාන්ත කමිටුව මගින් අනුමත කරක ලද මන්ත්‍රී යෝජනා**

**07.01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

07.01.01. ලේඛනාගාරයට රාක්කයක් සවි කිරීම. (දළ ඇස්තමේන්තුව රු.228,500.00)

07.01.02. තුරු උයනට දැලක් සවිකිරීම. (දළ ඇස්තමේන්තුව - රු.300,000.00)

07.01.03. Street Lighting Project (දළ ඇස්තමේන්තුව - රු.8,800,000.00)

07.01.04. සුදර්ශනපුර ප්‍රජා ශාලාවේ ඉඩම මැන ඉඩම වටා වැට ඉදිකිරීම.

ඉහත යෝජනා ගරු සභාපතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ Street Lighting Project සඳහා නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ රුපියල් ලක්ෂ 62ක මුදලක් පවතින බැවින් ඉතිරි ලක්ෂ 26 පමණක් සභා අරමුදලින් වැය කිරීමට සිදුවන බවයි.

එමෙන්ම තමන්ගේ උත්සහයෙන් තම නිලධාරී හිතවතෙකුගෙන් ලැබුණු පණිවුඩයක් මත හෝමාගම රෙජිස්ටාර් කාර්යාලවල පවතින මුද්දර ගාස්තු රු.3,794,000.00 මුදලක් ද කොළඹ රෙජිස්ටාර් කාර්යාලයේ තිබී රු.2,539,460.00 ක මුදලක් ද සොයා ගත් අතර හිමිකම් ඔප්පු

සඳහා රු.19,411,833.00 ක මුදලක් සභාවට ගෙන ඒමට හැකි වූ බවද එමගින් සභාව වෙත මිලියන 25 කට අධික මුදලක් හිමි වූ බැවින් ඒ සඳහා සහය ලබා දුන් ගණකාධිකාරී හා කාර්යාල නිලධාරී මහතුන් සඳහා ස්තුතිය පුදකරන ලදී.

අදාළ ව්‍යාපෘතිය සිදු කිරීමට යෝජිත ආයතන ගෙන්වා ඔවුන් සමඟ සාකච්ඡාවක් සිදු කර ආදාළ ආයතනය තෝරා ගැනීම සුදුසු බව සභාවේ මතය විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.02 ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා**

07.02.01 තම මන්ත්‍රී ප්‍රතිපාදනවල ඉතිරි කොටස සහ සභාපතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන වලින් කොටසක් යොදා කුමාරගම දෙවන පටුමග සංවර්ධනය කිරීම සඳහා මුදල් යෙදවීම.

ඉහත යෝජනාව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා ප්‍රදේශවාසීන්ගෙන් ලැබුණු දීර්ඝකාලීන ඉල්ලීමක් අනුව කුමාරගම දෙවන පටුමඟ සංවර්ධනය සිදු කරන බව ද ඒ සඳහා තමන්ගේ හා ගරු සභාපතිතුමාගේ මන්ත්‍රී ප්‍රතිපාදන යොදවන බව ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.03 ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

07.03.01 කිරිඳිගල වැලිහරනාව පාරේ සිට පොල්ගහගොඩ මාර්ගය නඩත්තු කිරීම.

07.03.02 කිරිඳිගල ග්‍රාම නිළධාරි කාර්යාලයේ වැසිකිළි වල ඉදිකිරීම.

07.03.03 තුරු උයන ඉහළ කොටස සංවර්ධනය කිරීම, හෙළ බොජුන්හල ඉදි කිරීම සහ ගස් සිටුවීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.04 ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

07.04.01. මුස්තාපා මාවත අලුත්වැඩියා කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.05 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

07.05.01.කරව්කැටිය වටරවුම් පාරේ, සිටි ගාඩ්න් පෙදෙසේ ජලටැංකිය මාර්ගයේ යෝජනා ස්ථිර කරන ලද මාර්ග නාම පුවරු ස්ථාන ගත කර දීම.

07.05.02. සිරි වීරසුන්දරාරාම මාර්ගයේ කුමාර විද්‍යාලය අසල කාණුවට කොන්ක්‍රීට් කැලි (ස්ලැබ්) යෙදීම.

07.05.03. කරව්කැටිය මාර්ගයේ එක් පැත්තක කොන්ක්‍රීට් කැලි (ස්ලැබ්) යොදා මාර්ගයේ ගමන් ගන්නා ජනතාවට සහනයක් සලසා දීම.

07.05.04. කරව්කැටිය මාර්ගයේ විධායක ඉංජිනේරු කාර්යාලය අසළ මාර්ගය පළල් කල හැකි ස්ථාන පළල් කර දීම.

07.05.05. හුණුකුඹුර මාර්ගය පටන් ගන්නා තැන කඩතොළු වී ඇති හංන්දිය පිළිසකර කර දීම.

07.05.06. තුරු උයන ඉහළ කොටස සංවර්ධනය කිරීම, හෙළ බොජුන්හල ඉදි කිරීම සහ ගස් සිටුවීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.06 ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමා**

2020 මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ සිදු කිරීමට නියමිතව තිබූ සඳුන්ගම සෝමේගේ නිවාස වෙත යන මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවට පහත යෝජනා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

07.06.01. ශාන්ත ජෝසප් මරණාධාර සමිතියට පහත උපකරණ ලබා දීම.

- පුටු 50 ක්
- ලොකු සාස්පාන් කට්ටලය 44200

07.06.02.කිව්ලේවෙල පාලමේ වැඩ අවසන් කිරීමට මන්ත්‍රී ප්‍රතිපාදන වලින් ඉතිරි වූ මුදල් යෙදවීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් සඳුන්ගම සෝමෙගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමේ දී විශාල පැති බැම්මක් සකස් කිරීමට ලක්ෂ 05කට අධික මුදලක් වැය වන අතර එම කර්මාන්තය වෙනත් ප්‍රතිපාදනයක් මගින් සිදු කරන තෙක් තමා වෙත ලැබීමට නියමිත මන්ත්‍රී ප්‍රතිපාදන තුළින් 07.06.01. හා 07.06.02 යෝජනාව සිදු කිරීමට අවශ්‍ය කටයුතු සඳහා අනුමැතිය ලබා දෙන ලෙස පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.07 ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

07.07.01 තම මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ හුණුකුඹුර කෝපිවත්ත මාර්ගයේ සුනිල් ගරාජය ඉහළ මාර්ගයේ පැතිබැම්ම ඉහළ කොටස සංවර්ධනය කිරීම.

07.07.02. කෝපිවත්ත මාර්ගයේ නාම පුවරුව සංවර්ධනය කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.08 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

07.08.01. තම පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ නගර සභා සීමාව තුළ පිහිටි උඩකන්ද පාර ප්‍රීමික්ස් යොදා සංවර්ධනය කර කාණුව සකස් කිරීම. රු.800,000.00

07.08.02. කරච්කැටිය කොටුගොඩැල්ල පාර ශාන්ත මහතාගේ නිවස ඉදිරිපිට කාණුව (මීටර් 100 ක ප්‍රමාණය) සකස් කිරීම.

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු උප සභාපති එම්.ටී.එම්.රූමි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07.09 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

07.09.01 පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ ඇල්ලෙඅරාව එක්සත් මාවත පැති බැම්ම සකස් කිරීම.

ඉහත කර්මාන්තය ලබා දීම - ඇල්ලෙඅරාව එක්සත් අවමංගල්‍යාධාර සමිතිය

ඉහත යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

08. මන්ත්‍රී යෝජනා

**08.01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

08.01.01 ඉදිරියේදී ඇති විය හැකි ගංවතුර තත්ත්වයකට මුහුණ දීමට සුදුසු පරිදි දොරවෙල ඔය දෙපස සහ ඔය මධ්‍යයේ ඇති බාධක සහ ජලය බැසීමට ඇති අවහිරතා ඉවත් කිරීමට සභාව මඟින් වැඩපිළිවෙලක් සැකසීම.

08.01.02 අසරණ වූ පවුලක් ජීවත්ව සිටින වාසය කිරීමට නොහැකි තත්ත්වයකට පත්ව ගරා වැටී ඇති නිවසක් අලුත්වැඩියා කිරීම සඳහා සෙවිලි තහඩු ලබා දීම. (පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන)

08.01.03 බුලත්ගම එක්සත් මිතුරු සංසඳයට (10X20) ප්‍රමාණයේ ආවරණ මඩුවක් ලබා දීම.(පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන)

08.01.04 තුඹගොඩ මංසන්ධියේ පැන්තාලියක් හෝ පොදු ජල කරාමයක් සවි කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා විසින් සථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා දොරවෙල ඔය මධ්‍යයේ සහ දෙපස ජලය බැස යාමට අවහිර වන පරිදි පවතින බාධක ඉවත් කිරීම සඳහා යන්ත්‍ර සූත්‍ර උපයෝගි කර ගැනීම සුදුසු බව සඳහන් කළේය. එමෙන්ම 08.01.03 යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බවද ඒ සඳහා අවශ්‍ය හට් එක මේ වන විට ලැබී ඇති බවද තුඹගොඩ මංසන්ධියේ පැන්තාලියක් ඉදි කිරීම සඳහා තම මන්ත්‍රී ප්‍රතිපාදනවලින් ඉතිරි මුදල් යොදවන බවද එම ස්ථානයේ ජල බිල්පත ගෙවීම පිළිබඳ ගැටලුවක් පැන නැඟී ඇති බවද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.02 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

08.02.01 බළන්ගොඩ කහටපිටිය පාර මුස්තාපා මාවතට පිවිසෙන මාර්ගය සම්පූර්ණයෙන් අබලන් වී ඇති බැවින් කඩිනමින් සංවර්ධනය කිරීම.

08.02.02 කල්තොට පාරේ එස්.ඩී.සී.සී.ආයතනය ආසන්නව ඇති මාර්ගයේ දැඩි අවධානම් කොටසේ ආරක්ෂිත ආවරණයක් යෙදීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට දැනුම් දීම.

08.02.03 හරක් මස් කඩය සඳහා පිටස්තර ප්‍රදේශවලින් මස් ප්‍රවාහනය කිරීම සඳහා අවසර ලබා ගැනීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා, මුස්තාපා මාවත කඩිනමින් සකස් කරන ලෙසද කල්තොට පාරේ එස්.ඩී.සී.සී.ආයතනය අසළ මාර්ගයෙහි ආරක්ෂිත වැටක් යොදන ලෙස ද පවසන ලදී. එමෙන්ම සතියට දින තුනක් පමණ හරක් මස් නොමැති වීම නිසා හරක් මස් කඩය වසා දමන බැවින් පිටස්තර ප්‍රදේශවලින් නීත්‍යානුකූලව මස් ප්‍රවාහනය කිරීම සඳහා අවසර ලබා දෙන ලෙස ද පවසන ලදී.
මෙහිදී අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා එම්.ජේ.මලීක්ෂා මැතිතුමා ගෙන ආ තුන්වන යෝජනාවට තමන් තරයේ විරුද්ධ වන බවද ඒ සඳහා අනුමැතිය ලබා නොදෙන ලෙසද පවසන ලදී. බළන්ගොඩ සෝ ඝාතකාගාරයේදී ඝාතනය කරන ගවයින් මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් විසින් පරීක්ෂා කරන නමුත් පිටතින් ගෙනෙන මස් පරීක්ෂා කිරීමට අවස්ථාවක් නොලැබෙන බවද පවසන ලදී. එමෙන්ම බළන්ගොඩ මුදල් බළන්ගොඩට ආයෝජනය කළ යුතු බවද මස් නොමැතිනම් මස් නොකා සිටින ලෙසද පවසන ලදී.
මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරීක මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා පිටස්තර ප්‍රදේශයකින් ගෙන ආවද එම ප්‍රදේශයේ නගර සභාව සතු කඩයකින් මස් ප්‍රවාහනය කරන බවට හරක් මස් කඩ බදුකරු පැවසූ බව පවසන ලදී

අනතුරුව අදහස් දක්වන ලද ගරු උප සභාපතිතුමා හරක් මස් නොමැතිනම් හරක් මස් කඩය ටෙන්ඩර් නොගත යුතු බවද එසේ නොමැතිනම් ගෝ ඝාතකාගාරය නගර සභාව වෙත පවරා ගැනීම සුදුසු බවද එසේ පවරා ගතහොත් හරක් මස් කඩ සඳහා විවෘත ටෙන්ඩරයක් ඉදිරිපත් කළ හැකි බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් හරක් මස් කඩ ටෙන්ඩර් කිරීමේදී පිටස්තර පුද්ගලයින් සඳහා ටෙන්ඩර්ය ඉදිරිපත් කළ නොහැකි බවට කොන්දේසියක් දැමූ අතර මෙලෙස පිටස්තර ප්‍රදේශවලින් මස් ප්‍රවාහනය කළහොත්

ඔවුන් නඩු දමනු ඇති බවද පවසන ලදී. එමෙන්ම පසුගිය මස නව වන දින සෙවනගල ප්‍රදේශයෙන් හොර හරක් ගෙනවිත් ගැටලුවක් ඇති වූ අතර ඒ සම්බන්ධයෙන් සභාව දැනුවත්දැයි විමසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා ඒ පිළිබඳව ලේකම්තුමිය විසින් තමුන් දැනුවත් කළ නමුත් නීත්‍යානුකූලව කිසිඳු ආයතනයකින් තමාව දැනුවත් නොකළ අතර මෙයට ප්‍රධාන හේතුව වන්නේ නගර සභාව සතුව ගෝ ඝාතකාගාරයක් නොමැති වීම බව පවසන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමා, බළන්ගොඩ එළ හරක් මස් කඩයේ විකුණන එළ හරක්මස්වල කටු වැඩි යැයි හෝ ගුණාත්මක පෝෂණ කොටස් නොමැතියැයි පවසමින් වෙනත් ක්‍රම මඟින් බළන්ගොඩ ජනතාව හරක් මස් සපයා ගන්නා බව පවසන ලදී. එමෙන්ම මස් විකිණීම මත සභාවේ ආදායම තර කර ගැනීම අභිප්‍රාය නොවුනද පිටස්තර ප්‍රදේශවල ජනතාවට හරක්මස් ටෙන්ඩරය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා නොදී සීමාසහිත කර ටෙන්ඩර් කිරීම නිසා වර්ෂයකට සභාව සඳහා මිලියන 1.2 ක මුදලක් අහිමි වූ නමුත් දැනට මෙය ක්‍රියාත්මක කළ නොහැකි බවද පවසන ලදී. එනමුත් තම අදහස වන්නේ බළන්ගොඩ නගර සීමාව තුළ ප්‍රාණඝාතය සිදු නොකර වෙනත් ප්‍රදේශයකින් හෝ මස් ගෙනවිත් ජනතාවගේ මූලික අයිතිවාසිකමක් වන මස් අනුභව කිරීමට අවස්ථාව ලැබීම සුදුසු බවයි. ඉදිරියේදී ගෝ ඝාතකාගාරය නගර සභාව වෙත පවරා ගැනීමට අවශ්‍ය කටුයතු සිදු කරන බවද හරක් මස් කඩ ටෙන්ඩර් කිරීමේදී පිටස්තර ප්‍රදේශවල ජනතාව සඳහා මස් කඩ ටෙන්ඩරය ගැනීමට ලබා නොදුන් නිසා මෙම තීන්දුව ගත නොහැකි බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා අදහස් දක්වමින් තමන් හරක් මස් පිළිබඳ විරුද්ධව කථා කරන බැවින් හරක් මස් ටෙන්ඩර්කරු තමා හමුවීමට පැමිණි බවද මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා විසින් නීත්‍යානුකූලව ගවයෙකු මැරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තිබේදැයි සොයා බැලිය යුතු බව ද හරක් මස් වෙළෙඳාම් කිරීමේදී හරක් මස් හොරට කිරන බවට පාරිභෝගිකයින්ගෙන් චෝදනා ලැබෙන බැවින් ඒ සඳහා ඉලෙක්ට්‍රෝනික් තරාදියක් තබන ලෙසද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් ප්‍රදේශීය සභා සීමාවකින් තවත් ප්‍රාදේශීය සභා සීමාවකට මස් ප්‍රවාහනය කිරීමට නොහැකි බවද එසේ ප්‍රවාහනය කිරීමට මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගේ අනුමැතිය ලබා ගත යුතු බවද ගවයෙකු මැරීමේදී එම ගවයාගේ තොරතුරු සටහන් කර පත්‍රිකාවක් පිළියෙල කරන අතර මෙසේ පිටස්තර ප්‍රදේශවලින් මස් ප්‍රවාහනය කිරීමේදී එසේ තොරතුරු සටහන් කර ගැනීම හා මඩු ගාස්තු අයකිරීම සිදු කරන්නේ කෙසේදැයි විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් පොදු වෙළෙඳසැල සඳහා පොදු තරාදියක් ස්ථානගත කිරීම සඳහා තමන් මීට පෙර සභාවකද යෝජනා කළ බව පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් 08.02.01 හා 08.02.02 යෝජනා පමණක් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.03 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

08.03.01 ඩබ්.එල්.පියසීලි මියගෙන් නගර සභාව වෙත අයවිය යුතු සියලු මුදල් අයකර ගැනීමෙන් අනතුරුව ඉතිරි මුදල නැවත ඩබ්.එල්.පියසීලි මියට ලබා දීමට යෝජනා කරමි.

08.03.02 අනඳමෙත්ගම බණ්ඩාරවත්ත මහතාගේ නිවස ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම.

08.03.03 අනඳමෙත්ගම තැපැල් කණුව ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කිරීම.

08.03.04 එක්සත් සමගි සුභ සාධක සමිතියට අවශ්‍ය උපකරණ ලබා දීම.

08.03.05 නිවාස සැලසුම් අනුමත කිරීමට අවශ්‍ය ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වාර්තා ලබා ගැනීමට අප ප්‍රදේශවාසීන්ට රත්නපුර යාමට සිදුවේ. එම ආයතනය දැනුවත් කර නිළධාරියෙකු සතියකට වරක්වත් මෙම සභාව වෙත ගෙන්වා ගැනීමට අවශ්‍ය නීතිමය පරිසරය සැකසීම

08.03.06 අංක 06 කාර්පාක් කඩ කාමරය වංචනික ලෙස අයෙකු ලබා ගෙන ඇත, (කූට ලේඛන සකස් කර) මේ සම්න්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන ලෙස ඉල්ලීම

08.03.07.සභාවේ ප්‍රතිපාදන මත වෙන්කරන ලද රු. 175,000 මුදලින් සෝමා කන්දෙගෙදර මහත්මියගේ නිවාසවලට යන මාර්ගයත් රු. 175,000 මුදලින් සිසිර මහතාගේ නිවාස වලට යන මාර්ගයත් මා වෙත ලබාදෙන රු.ලක්ෂ 08 මුදල ඇතුළත 186,000 හා 180,000 පරිදි සංශෝධනය කිරීම

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී තරංගනී සමරසේකර මැතිතුමිය අදහස් දක්වමින් බළන්ගොඩ නගර සභාව ටෙන්ඩර් ලබා ගත් ඩබ්.එල් පියසීලි විසින් ලක්ෂ 65 ක මුදලක් සභාව වෙත ගෙවා ඇති අතර එයින් විදුලි බිල්, වතුර බිල් ආදි අයවිය යුතු සියළු මුදල් අය කර අදාළ ටෙන්ඩර්කරුට ලක්ෂ 38ක මුදලක් පමණක් ගෙවා ඇති බවද මේ වන විට නගර සභාව සතුව ඩබ්.එල් පියසීලි විසින් ගෙවා ඇති ලක්ෂ 22 ක මුදලක් පවතින බවද පවසන ලදී. එමෙන්ම ටෙන්ඩරය ලබා ගත් පසු පැයක් ඇතුළත මුදල් ගෙවීමට අවශ්‍ය බැවින් වාහන ලීසිං කර, රත්තරං බඩු පවා උකස් කර ඩබ්.එල් පියසීලි විසින් එම මුදල් ගෙවා ඇති බවද

තානායම් ටෙන්ඩර් ගිවිසුමේ කොතැනක හෝ එම මුදල් ආපසු ගෙවිය නොහැකි බවට සඳහන්ව නොමැති බව පවසන ලදී.

මේ පිළිබඳව කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභාව කාරක සභාවක් බවට පත්කරන ලදී.

ලේකම්තුමියගේ කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු උප සභාපති එම්.ටී.එම්.රුමී මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව ගරු සභාවක් බවට පත්කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා පවසා සිටියේ මෙම ටෙන්ඩර්කරු විසින් නියමිත කාලයට පෙර තානායම භාර දී තානායමේ ගිවිසුම් කොන්දේසියක් උල්ලංඝනය කර ඇති බැවින් ඇය විසින් ගෙවා ඇති ගිවිසුම් ඇප තැම්පත් මුදල සභාව සතු වී ඇති බවයි.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් අදාළ ටෙන්ඩර්කරුට අසාධාරණයක් සිදුවී ඇති නම් අධිකරණය දක්වා යා හැකි බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය 2018-05-28 දිනැති මහ සභාවේදී කාර් පාර්ක් අංක 06 කඩ කාමරය පිළිබඳ ආණ්ඩුකාරතුමා දැනුවත් කර ලිපියක් යැවීමට තීන්දුවක් ලබා ගන්නා ලද අතර එම ලිපිය යවා ඇත්දැයි විමසන ලදී. එමෙන්ම මාස හතරක කාලයක් ඉන්දික පැතුම් යන අයගේ මෙම කඩ කාමරය සඳහා අරුණි ගමගේ නමින් මුදල් ගෙවා ඇති බැවින් මෙම කඩ කාමරය අරුණි ගමගේ යන අයගේ නමට පැවරීමට ආණ්ඩුකාරතුමා තීරණය කර ඇති  ඇති අතර මෙම තීන්දුව වැරදි නමුත් මේ පිළිබඳව විමර්ශනයක් කර නොමැති බව ද සභාව විසින් ගන්නා ලද තීන්දුව බලවත් බව ද මේ පිළිබඳව විමර්ශනයක් සිදු කිරීම සුදුසු බවද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් සභාව විසින් යම් තීන්දුවක් ලබා ගත්තද ඒ ගත්තා වූ තීන්දුව අදාළ විෂය භාර ඇමති වන මහ ඇමති එසේත් නොමැතිනම් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කර එම තීන්දු තීරණ සමඟ පළාත් පාලන කොමසාරිස් හා පළාත් පාලන ලේකම්වරයාගේ තීන්දු තීරණ ද අනුව අදාළ නීති පද්ධතිය සමඟ අදාළ කටයුතු සිදු කරන බව පැවසීය. එමෙන්ම මෙම කඩ කාමරය පැතුම් ඉන්දික යන අය විසින් ටෙන්ඩර් මඟින් ලබා ගැනීමෙන් අනතුරුව අරුණි ගමගේ යන අය වෙත අතුරුබදු දී ඇති අතර ඇය නීතිඥවරියක් බැවින් ආණ්ඩුකාරතුමා වෙත ගොස් අදාළ කඩ කාමරය තමන්තේ නමට පවරාගෙන ඇති බව ද ගරු ආණ්ඩුකාරතුමාගේ ලිපිය මත නගර සභාවේ නිලධාරීන්ට අදාළ කඩ කාමරය අරුණි ගමගේ යන අය වෙත පැවරීමට සිදුවූ බවද පවසන ලදී.

එමෙන්ම සභාව විසින් ගනු ලබන්නේ ප්‍රතිපත්තිමය තීන්දුවක් වුවද මෙය ක්‍රියාත්මක කිරීමේ නීතිරීති පවතින්නේ පළාත් සභාව සතුව බවද සභාව විසින් ගනු ලබන තීන්දු තීරණ වැරදි

වීමට පුළුවන් බව ද පවසන ලදී. එමෙන්ම අරුණි ගමගේ යන අයට පදික කඩ කාමරයක් ලබා දීමට අද දින සභාවේ තීන්දු වූ අතර එම කඩ කාමරය දීම සුදුසු බව ද පවසන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, 08.03.05 යෝජනාව පරිදි නාගරික සංවර්ධන අධිකාරියේ නිළධාරියෙකුට මෙම සභාවේ රැඳී සිටීමට නොහැකි වන බවද 08.03.06 යෝජනාව අනුව කාර් පාක් අංක 06 කඩ කාමරය ඉන්දික පැතුම් විසින් අරුණි ගමගේ යන අයට අතුරු බදු දී ඇති අතර ඒ මත පදනම්ව ගරු ආණ්ඩුකාරතුමා ලබා දුන් තීන්දුව අභියෝගයට ලක්කළ නොහැකි බව ද ගරු ආණ්ඩුකාරතුමා යනු ජනාධිපතිතුමාගේ නියෝජිතයෙකු බව ද පවසන ලදී. එමෙන්ම අවශ්‍යනම් පෞද්ගලිකව විමර්ශනයක් ඉල්ලා සිටින ලෙස ගරු මන්ත්‍රීතුමියට පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින්** 08.03.06 හැර **ඉහත සඳහන් ඉතිරි යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08.04 ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

08.04.01. මාස කිහිපයකට කලින් ඉදිරිපත් කරන ලද වෙන් වෙන් වශයෙන් මාර්ග හඳුනා ගැනීම සඳහා පටුමඟ නමින් කරව්කැටිය වටරවුම මාර්ගයේ සහ සිටි ගාඩන් මාර්ගවලට බෝඩ් සවි කිරීම.

08.04.02. බළන්ගොඩ පොලිසියේ බැරැක්කය අසලින් දිවෙන කියවීම් ශාලාව ඇති මාර්ගය දෙපස කැඩී බිඳී ගොස් ඇති බැවින් නඩත්තු කටයුතු කර දීම.

08.04.03. මුගුණමලේ පයින් ගමන් කිරීමට තිබූ මාර්ගයේ පාලම යථා තත්ත්වයට පත් කිරීමට හැකි ඉක්මනින්ම පියවර ගැනීම.

08.04.04.දොරවෙල ප්‍රධාන පාලම යට පරණ පාලමේ කොටස් තවමත් ඇති අතර එම ඉතිරි වූ යකඩ බාර් මගින් වෙනත් කොට්ඨාශයක ඇති මාර්ග සංවර්ධනය කළ හැක. එම යකඩ වලින් ප්‍රයෝජනය ගැනීම.

08.04.05. බළන්ගොඩ නගරයේ ඉතාම ජනාකීර්ණ හා වැඩිපුරම සෙනඟ ගැවසෙන මහජන බැංකුව සහ තානායම අසළ අඹ ගහ වටේ බැම්ම කැඩී ගොස් ඇත. නගරයේ අලංකරණයට එම ස්ථාන ඉතා වැදගත් බැවින් නැවත සාදා සංවර්ධනය කර දීම.

08.04.06. කරව්කැටිය වට රවුම් පාරේ විධායක ඉංජිනේරු කාර්යාලයට අසළ මාර්ගය / හන්දිය උපරිම ලෙස පළල් කල හැකි අයුරින් පළල් කර සංවර්ධනය කිරීම.

08.04.07 ඇති වූ ගංවතුරට හැරි ඇති නගර සභාවේ රථ අංගනය ඉදිරිපිට ඇති වාහන නැවතුම්පල (PARK ) මට්ටම් කර නඩත්තු කරදීම.

08.04.08. බළන්ගොඩ පොලීසිය බැරැක්කය අසළ කියවීම් ශාලාව ඉදිරිපිට නගර සභාව සතු නිවෙස් දෙක තිබෙන ස්ථානයේ ෆ්ලැට් ක්‍රමයට ගොඩනැගිල්ලක් ඉදිකර ක්වාටස් වෙනුවෙන් හෝ කුලියට දිය හැකි හෝ වාණිජ වටිනාකමක් ඇති ගොඩනැගිල්ලක් ඉදිකිරීම.

08.04.09.විශාල වාණිජ වටිනාකමක් ඇති "පත්තිනි කෝවිල " අසළ නගර සභාව සතු නිවෙස් අයින්කර නවීන ගොඩනැගිල්ලක් ඉදිකර ඉහළ වටිනාකමක් ඇති කටයුත්තකට ප්‍රයෝජනයට ගැනීම.

08.04.10. කරව්කැටිය මාර්ගයේ කොටුගොඩැල්ල පාර දක්වා පෙට්ටිගල මාර්ගයට යාවන වටරවුම් පාරේ නගර සභාව සිට දෙමළ විද්‍යාලය දක්වා එක් පැත්තක කානුව වසා කොන්ක්‍රීට් ස්ලැබ් යොදා සංවර්ධනය කිරීම.

ඉහත යෝජනා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ප.ව.02.35 ට පමණ ගරු සභාවෙන් පිටව යන ලදී.**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් 08.04.01. යෝජනාව සඳහා අවශ්‍ය බෝඩ් ආයතනයක් සමග සාකච්ඡා කර සකස් කිරීමට හැකි අතර බළන්ගොඩ පොලිසියේ බැරැක්කය අසලින් දිවෙන කියවීම් ශාලාව ඇති මාර්ගය දෙපස කැඩී ගොස් ඇති බැවින් සංවර්ධනය කර දෙන ලෙස ද මහජන බැංකුව සහ තානායම අසළ අඹ ගහ වටේ බැම්ම කැඩී ගොස් ඇති අතර එම බැම්ම උසට සකස් කරන ලෙස ද පවසන ලදී. කරව්කැටිය වට රවුම් පාරේ විධායක ඉංජිනේරු කාර්යාලයට අසළ මාර්ගය / හන්දිය ජනාකීර්ණ බැවින් උපරිම ලෙස පළල් කල හැකි අයුරින් පළල් කර සංවර්ධනය කරන ලෙසද නගර සභාව සතු ක්වාටස් පවතින ස්ථානවල වාණිජ වටිනාකමක් ඇති ගොඩනැගිල්ලක් සමග ක්වාටස් ඉදිකරන ලෙස ද පවසන ලදී. එමෙන්ම ඉතිරි යෝජනා පිළිබඳ අවධානය යොමු කරන ලෙස ද පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **7,511,628.54** |
| වෙනත් ලැබීම් | **1,540,671.71** |
| මුලු ලැබීම් | **9,052,300.25** |
| පුනරාවර්තන වියදම් | **8,777,168.09** |
| වෙනත් වියදම් | **11,497,104.85** |
| මුලු වියදම් | **12,411,687.61** |

**2020-06-01 දින සිට 2020-06-30 දක්වා ඉන්ධන වාර්තාව**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 19,163.04 |
| 227-5020 | 48,916.00 |
| RD - 8240 | 22,677.20 |
| 226-7521 | 20,800.00 |
| BC-0005 | 37,440.00 |
| GC 0001 | 14,760.00 |
| | 1,500.00 |
| LL - 7688 | 11,960.00 |
| DPP 0006 | 19,710.00 |
| RD 8000 | 19,876.48 |
| HF - 8558 | 19,032.00 |
| FP 0002 | 8,400.00 |
| RB 4786 | 1,040.00 |
| GK-1483 | 6,240.00 |
| GK-6227 | 19,901.04 |
| JD-4684 | 2,740.00 |
| LL-2110 | 10,439.48 |
| ND-5124 | 26,028.08 |
| PF-4006 | 28,390.56 |
| QL-2901 | 5,267.65 |
| 37-7933 | 4,888.00 |
| RC-1107 | 28,233.20 |
| RC 1118 | 36,837.12 |
| ZA 9835 | 17,539.92 |
| DD Roller | 2,080.00 |
| UQ - 1933 | 3,219.50 |
| HF 7899 | 58,691.68 |
| | 538.00 |
| | 8,000.00 |
| OV M 0017 | 2,740.00 |
| ZA 5039 | 51,602.72 |
| YG-0758 | 2,055.00 |
| එකතුව | **560,706.67** |

**මෙදින සභාවට ඉදිරිපත් කරන ලද ආදායම් වියදම් වාර්තා හා ඉන්ධන වාර්තා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10. ඇස්තමේන්තු අනුමත කිරීම.**

**10.01 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

10.01.01 දෙණියකුඹුර සුමිත් දයානන්ද මහතාගේ නිවස පාර ඉතිරි කොටස පැතිබැම්ම සාදා මාර්ගය සංවර්ධනය කිරීම - ඇස්තමේන්තු මුදල - රු.452,000.00

10.01.02 පුවක්ගහමුල්ල පාරේ අතුරු මාර්ගයේ මහේෂ් නිමන්ත මහතාගේ නිවසට යන පාර සංවර්ධනය කිරීම. - ඇස්තමේච්තු මුදල - රු.200,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10.02 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

10.02.01 දොරවෙල සිසිර මහතාගේ නිවස අසළ මාර්ගය සංවර්ධනය කිරීම. - ඇස්තමේන්තු මුදල - රු.180,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තු ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10.03 ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා**

10.03.01 කිච්ලේවෙල පාලමේ ඉතිරි කොටස ඉදි කිරීම. - ඇස්තමේන්තු මුදල - රු.150,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්ප කුමාර මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10.04 ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා**

10.04.01 දෙහිගල්තලාව මුස්ලිම් පල්ලියේ මායිම්තාප්පය ඉදි කිරීම - ඇස්තමේන්තු මුදල - රු.274,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රී එම්.ජේ.මලීක්ෂා මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10.05 ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

10.05.01 ඇල්ලෙඅරාව එක්සත් මාවත පැති බැම්ම සංවර්ධනය කිරීම. - ඇස්තමේන්තු මුදල - රු.760,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**10.06 ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා**

10.06.01 ඕලුගංතොට පුරණගෙදර පාර සංජීව මහතාගෙ ණිවස අසල පැති බැම්ම ඉදි කිරීම. ඇස්තමේන්තු මුදල - 177,597.25

10.06.02 ඕලුගංතොට සියඹලාගහවත්ත මාර්ගය සංවර්ධනය කිරීම. - ඇස්තමේන්තු මුදල - 370,000.00

ඉහත සඳහන් ඇස්තමේන්තු ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත ඇස්තමේන්තුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා**

විශේෂ මහ සභාවේදී සාකච්ඡා කරගත් පරිදි රු.10,000.00 ක උපරිමයකට යටත්ව ආධාරය ලබා දීමේ තත්ත්වය කෙසේදැයි විමසන ලදී.

එමෙන්ම හුණුකුඹුර පාරේ, පළමුවන පාලම අසල පැතිබැම්ම ඉදි කිරීම බළන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කෙරෙමින් පැවති නමුත් මෙම දිනවල එම ඉදිකිරීම් නතර කර ඇති බව ද සභා අරමුදලින් මුදල් වෙන් කිරීමට ප්‍රථමව ඉදිරියේ දී මෙම කාර්යය ඉටු කරන්නේ ද යන්න සම්බන්ධව එම ආයතනයෙන් විමසීමක් සිදු කරන ලෙස ද පැවසීය.

මෙහිදී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා ව්‍යාපාරිකයින් විසින් අසත්‍ය තොරතුරු ලබාදීම හේතුවෙන් ව්‍යාකූල තත්ත්වයක් හට ගත් බැවින් එම ආධාරය ලබා දීමේ කටයුතු තාවකාලිකව නතර කර ඇති බවත් එසේම ගංවතුරෙන් නගරයට සිදු වූ අලාභ හානි පිළිසකර කිරීම සඳහා විශාල මුදලක් වැය වන බැවින් 2020-06-30 දින විශේෂ මහ සභාවේදී මෙම ආධාරය ලබා නොදීමට සාකච්ඡා කළ බව පවසන ලදී.

**ගරු උප සභාපති එම්.ටී.එම්.රුමි මැතිතුමා**

පසුගිය දිනෙක ඇති වූ ගංවතුරෙන් අනතුරුව ඒ පිළිබඳව අවධානය යොමුකර දොරවෙල ඔය පිළිසකර කිරීම වෙනුවෙන් කටයුතු කළ ගරු සභාපතිතුමා ඇතුලු සියලු නිළධාරීන් සඳහා ස්තූතිය පුද කරන ලදී. එමෙන්ම දීර්ඝකාලීනව අබලන්ව පැවති තලාව මාර්ගය සංවර්ධනය කිරීමේදී ප්‍රදේශවාසීන් විසින් දැක්වූ සහයෝගය සඳහා විශේෂ ස්තූතියක් පුද කරන බවද නගර සභාව විසින් දීර්ඝ කාලීනව කරුණු දෙකක් ඉල්ලා සිටි අතර ඒ අනුව කල්තොට පාරේ මුස්ලිම් පල්ලිය අසළ සහ ආනන්ද මෛත්‍රී විද්‍යාලය අසළ කාණුව කොන්ක්‍රීට් ස්ලැබ් යොදා සකස් කිරීම සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ස්තූතිය පුද කරන ලදී. එමෙන්ම ඒ.විලියම් මාවත සංවර්ධනය කිරීම වෙනුවෙන් එම ප්‍රදේශවාසීන් ඉතා සතුටින් සිටින බවත්, එම ප්‍රදේශවාසීන්ගේ සහයෝගය ඒ සඳහා ලැබුණු බවත්, ඒ වෙනුවෙන් මන්ත්‍රී ප්‍රතිපාදන ලබා දීම පිළිබඳ ගරු සභාපතිතුමාට ස්තූතිය පුද කරන බවත් පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් බොහෝ දෙනෙකු සවස් කාලයේ ක්‍රීඩා කිරීම සඳහා බළන්ගොඩ මහජන ක්‍රීඩාංගනය පැමිණෙන අතර රාත්‍රියෙහි විදුලි පහන් දැල්වීමක් සිදු නොකරන බැවින් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස පැවසූ ගරු නාගරික මන්ත්‍රීතුමා, දොරවෙළ ඔය පුළුල් කිරීම පිළිබඳ ස්තූතිය පුද කර සිටින ලදී. එමෙන්ම බළන්ගොඩ සුසාන භූමිය ඒ අවට ජනතාව විසින් අල්ලා ගෙන ඇති බැවින් එය වළක්වාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද ගල්වල පාර නඩත්තු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම පිළිබඳ ස්තූතිය පුද කරන බව ද තම පෞද්ගලික ප්‍රතිපාදන යටතේ සිදු

කිරීමට අපේක්ෂිත කර්මාන්ත සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද ඉල්ලා සිටිමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී ජී.චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින්, ගංවතුර නිසා එගොඩ හුණුකුඹුරට අවහිරයක්ව පැවති කාණුව සකස් කිරීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කල අතර, කෝපිවත්ත මාර්ගයේ නාම පුවරුව සකස් කරදෙන ලෙස පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා අදහස් දක්වමින් ඇල්ෆාවත්ත මාර්ගයට වතුර ලබා දීම පිළිබඳ ස්තුතිය පුද කළ අතර තුඹගොඩ බස්නැවතුම්පල යාචකයෙක් නැවතී සිටින බැවින් ඔහු එම ස්ථානයෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින්, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපාරිකයින්ට සහන ලබා දීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත මේ වන විට ලිපි ඉදිරිපත් කර ඇති බැවින් ඒ සඳහා අනුමැතිය ලබා දෙන තෙක් කඩ කාමර වල කුළිය වාරික ලෙස ගෙවීමට කඩහිමියන්ට අවස්ථාව සලසා දෙන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා නව මහජන පොළ පිරිමි වැසිකිළිය දුර්ගන්ධය හමන බැවින් එය සකස් කරන ලෙසද මාළු විකුණන ස්ථානයේ කාණුව සකස් කිරීම හොඳ ක්‍රියාවක් වන අතර එහි එක් පැත්තක් පහත් වීම නිසා ජලය බැස නොයන බැවින් එය සකස් කරන ලෙස ද පවසන ලදී. එමෙන්ම මාළු කඩය අසළ කොන්ක්‍රීට් ස්ලැබ් යොදන ලෙස ද පොදු වෙළෙඳසැලෙහි පිවිසුම අසළ මාර්ගයේ ගැට්ට උස බැවින් එය සකස් කරන ලෙසද බස්නැවතුම්පල පදික කඩ කාමර 32 හි ෆ්ලෑෂ් ලයිට් සවිකිරීම ඉක්මනින් සිදු කරන ලෙසද පවසන ලදී.

වැඩිදුරටත් අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීතුමා බස්නැවතුම්පල පහළ මාලයේ වෙළෙඳ බලපත්‍ර ලබා නොගත් කඩ හිමියන් හට සහන කාලය ලබා දීම සඳහා අනුමැතිය ලැබෙන තෙක් මුදල් අය නොකර සිටින ලෙසද පිට්ටනිය පිටුපස මාර්ගය සංවර්ධනය කරන ලෙසද කොම්පෝස්ට් පොහොර දුගඳ හමන බැවින් එය වළක්වා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12. අවසානය**

අද දින මහ සභාව සඳහා සහභාගිවූ ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය හා ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුද කිරීමෙන් අනතුරුව මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.3.35 ට පමණ අවසන් විය.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.